# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2007 අංක 55 දරන පලාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2007 නොවැම්බර් මස 16 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 4.00 යි. තැපැල් ගාස්තුව : රු. 5.00 යි.

# 2007 අංක 55 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2007 නොවැම්බර් මස 16 වන දින]

එල්. ඩී.—ඕ. 48/2007.

**අනපේක්ෂිත හා හදිසි අවස්ථාගත කරුණු හේතුකොටගෙන ඡන්ද විමසීම් පැවැත්වීම කල් තබනු ලැබූ උතුරු පළාතේ මහ නගර සභාවක්, නගර සභා පහක් සහ ප්‍රාදේශීය සභා විසිහතක් සඳහා අලුතින් නාමයෝජනා කැඳවීම සහ ඡන්ද විමසීම් පැවැත්වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

උතුරු පළාතේ සියලු මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම සම්බන්ධයෙන් නාම යෝජනා භාරගනු ලබන බවට දැන්වීම්, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ කර ඇති හෙයින් ද: පූර්විකාව.

එකී පළාත් පාලන ආයතන අතුරින් ඉහත කී මහ නගර සභාව, නගර සභා පහ සහ ප්‍රාදේශීය සභා විසිහත වෙනුවෙන් වූ ඡන්ද විමසීම් සඳහා නියම කරන ලද දිනය හදිසි හා අනපේක්ෂිත අවස්ථාගත කරුණු හේතුකොටගෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයන් මගින් වරින්වර කල් දමනු ලැබූ හෙයින් ද:

එකී නාමයෝජනා භාර දුන් තැනැත්තන් මිය යාම හෝ අවතැන්වීම හෝ සිය පක්ෂ වෙනස් කිරීම, නාම යෝජනා භාර දුන් තැනැත්තන් සැලකිය යුතු සංඛ්‍යාවක් විදේශගතවීම යන කරුණු හේතුවෙන් හෝ යථෝක්ත නාම යෝජනා කැඳවනු ලැබූ අවස්ථාවේ දී වයස අවුරුදු තිස්පහට අඩු වූ අපේක්ෂකයන් දැන් වයස අවුරුදු තිස්පහ ඉක්මවා ඇති හෙයින් ඉහත කී මහ නගර සභාව, නගර සභා පහ සහ ප්‍රාදේශීය සභා විසිහත සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වී ඇති හෙයින් ද:

එකී මහ නගර සභාව, නගර සභා පහ සහ ප්‍රාදේශීය සභා විසිහත සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු ඉකුත් වී ඇති කාලය හේතුකොට ගෙන එකී මහ නගර සභාව, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අලුතෙන් නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද, අලුතින් ඡන්ද විමසීම පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද අවශ්‍යව ඇති හෙයින් ද:

2-PL 002526—3,600 (2007/10)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2007 අංක 55 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇතැම් මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නාමයෝජනා සහ තබා ඇති තැන්පතු සම්බන්ධයෙන් විධිවිධාන.

2. (1) මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" ලෙස දක්වනු ලබන (262 වන අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම් ප්‍රකාර, පිළිවෙළින් මේ පනතේ I වන, II වන සහ III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභාව, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍ර, කිසි විටෙකත් ඉදිරිපත් කරනු නොලැබුවාක් මෙන් වලංගු නොවන හා බලාත්මක නොවන ලෙස ද මෙයින් සලකනු ලැබේ.

(2) පිළිවෙළින් මේ පනතේ I වන, II වන සහ III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභාව, නගර සභා සහ ප්‍රාදේශීය සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන්, ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පළ කරන ලද දැන්වීම් මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

(3) පිළිවෙළින් මේ පනතේ I වන, II වන සහ III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභාව, නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට තෝරා පත්කර ගැනීම සඳහා ස්වාධීන කණ්ඩායමක් විසින් නම් කරනු ලැබූ අපේක්ෂකයන් සම්බන්ධයෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය යටතේ කර ඇති තැන්පතු, ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ තමන් වෙත නිකුත් කරනු ලැබූ ලදුපතක් එවැනි තැන්පතුවක් තැබූ තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලැබූ විට, ඒ තැන්පතුව කළ දින සිට මුදල් ආපසු ගෙවනු ලබන දිනය දක්වා වූ කාලය සඳහා වර්ෂයකට සියයට දොළහ බැගින් වූ පොළියක් සමග ඒ තැන්පත් මුදල ඒ තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා ආරම්භ කළ යුතු පියවර.

3. පිළිවෙළින් මේ පනතේ I වන, II වන සහ III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් මහ නගර සභාව, නගර සභා පහ සහ ප්‍රාදේශීය සභා විසිහත සඳහා ඡන්ද විමසීම පිණිස, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පියවර ගැනීම ආරම්භ කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ප්‍රධාන ප්‍රඥප්තියට අනුකූලව, නාමයෝජනා පිළිබඳ දැන්වීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර, ඒ දිනය මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට මාස හයකට පසු දිනයක් නොවිය යුතු ය.

4. (1) වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, තමාගේ ඡන්දපොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන එම ඡන්දපොළේ දී පිළිවෙලින් මේ පනතේ I වන, II වන සහ III වන උපලේඛනවල නිශ්චිතව සඳහන් කර ඇති මහ නගර සභාව, නගර සභා පහ සහ ප්‍රාදේශීය සභා විසිහත සඳහා සාමාජිකයන් තෝරා පත් කර ගැනීමට පවත්වනු ලබන ඡන්දයක දී තමාගේ ඡන්දය පාවිච්චි කිරීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති යම් ලියාපදිංචි ඡන්ද හිමියකු විසින්, තමාගේ ඡන්දය, (මෙහි මින් මතු "කොමසාරිස්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඔහුගේ පරම අභිමතය මත තීරණය කරනු ලබන්නා වූ, වෙනත් ඡන්දපොළක දී පාවිච්චි කිරීමට අවසර දෙන ලෙස ඉල්ලා සිටිමින් කොමසාරිස්වරයා නිශ්චිතව දක්වනු ලබන ආකෘතියක වන ඉල්ලුම්පත්‍රයක්, නාම යෝජනා දැන්වීමෙන් එක් සතියක් ඇතුළත දී ඉදිරිපත් කළ හැකි ය. අවතැන් වූ තැනැත්තන්,

(2) ඉල්ලුම්පත්‍රයක් ලැබීමෙන් සතියක් ඇතුළත කොමසාරිස්වරයා විසින් එම ඉල්ලුම්පත්‍රය භාර ගන්නා ලද බව හෝ ප්‍රතික්ෂේප කරන ලද බව එම ඡන්ද හිමියාට දැන්විය යුතු ය. කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද ඉල්ලීම භාර ගනු ලැබීමට තීරණය කළ විට, කොමසාරිස්වරයා විසින් වහාම ඡන්ද හිමියාට ඔහුගේ ඡන්දය පාවිච්චි කිරීමට හිමිකම ඇති ඡන්දපොළ දැනුම් දිය යුතු ය.

(4) කොමසාරිස්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ ඉල්ලුම් පත්‍ර පිළිගනු ලැබ ඇති ලියාපදිංචි ඡන්ද හිමියන්ගේ නම් ලැයිස්තුවක් පරීක්ෂා කරනු ලැබීම සඳහා ඒවායේ පිටපත් තම කාර්යාලයේ සහ අදාළ දිස්ත්‍රික් කාර්යාලවල තැබීමෙන්, එම නම් ලැයිස්තුව ප්‍රසිද්ධ කරනු ලැබීමට සැලැස්විය යුතු ය.

(5) එවැනි ඡන්ද පාවිච්චි කර ඇති අවස්ථාවක දී එම ඡන්දය, එම ඡන්ද හිමියා ලියාපදිංචි වී ඇති පළාත් පාලන ආයතනයේ ඡන්ද සමග ගණන් කරනු ලැබිය යුතු ය.

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

I වන උපලේඛනය

**මහ නගර සභා**

1. යාපනය මහ නගර සභාව

II වන උපලේඛනය

**නගර සභා**

1. වැල්වැටිතුරෙයි නගර සභාව
2. පේදුරුතුඩුව නගර සභාව
3. චාවාකච්චේරි නගර සභාව
4. වවුනියාව නගර සභාව
5. මන්නාරම නගර සභාව

III වන උපලේඛනය

**ප්‍රාදේශීය සභා**

1. කරෙයිනගර් ප්‍රාදේශීය සභාව
2. කයිට්ස් ප්‍රාදේශීය සභාව
3. ඩෙල්ෆ්ට් ප්‍රාදේශීය සභාව
4. වේලනෙයි ප්‍රාදේශීය සභාව
5. වලිකාමම් බටහිර ප්‍රාදේශීය සභාව
6. වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව
7. වලිකාමම් නිරිත ප්‍රාදේශීය සභාව
8. වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව
9. වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය සභාව
10. වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව
11. පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව
12. චාවාකච්චේරි ප්‍රාදේශීය සභාව
13. නල්ලූර් ප්‍රාදේශීය සභාව
14. පච්චිලායිපල්ලි ප්‍රාදේශීය සභාව
15. කරච්චි ප්‍රාදේශීය සභාව
16. පූනාකරි ප්‍රාදේශීය සභාව
17. මන්නාරම ප්‍රාදේශීය සභාව
18. නානට්ටාන් ප්‍රාදේශීය සභාව
19. මුසාලෙයි ප්‍රාදේශීය සභාව
20. මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව
21. වවුනියාව උතුර ප්‍රාදේශීය සභාව
22. වෙන්කලචෙට්ටිකුලම් ප්‍රාදේශීය සභාව
23. වවුනියා දකුණ (දෙමළ) ප්‍රාදේශීය සභාව
24. වවුනියා දකුණ (සිංහල) ප්‍රාදේශීය සභාව
25. මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව
26. තුනුක්කායි ප්‍රාදේශීය සභාව
27. මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.